# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,041 — 1934ක්වූ මාර්තු මස 28 වෙනි දිනවූ බදාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමයි.

(මධ්‍යම පන්තියේ ලාංකිකයන්ට පමණයි.) හම්බන්තොට දිස්ත්‍රික්කය, 1934 ඊ නො. 1.

මෙහි පහත විස්තර සඳහන්වන ඉඩම් ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් ඒ ඉල්ලුම්පත්‍ර ලැබුනාට පසු දැනුම්දෙනුලබන ඉඩම් කච්චේරියකදී පරීක්ෂාකොට කල්පනාවට ගන්නාබව මෙසින් දැනුම්දෙනු ලැබේ. ඉහතකී ඉඩම් සම්බන්ධ වැඩි විස්තර කරුණු හම්බන්තොට කච්චේරියෙන්ද, ගාල්ලේ මිනින්දෝරු කන්තෝරුවෙන් හෝ කොළඹ සර්වේයර් ජනරල් කන්තෝරුවෙන්ද ඒ ඒ කන්තෝරුවල වැඩකරන කාලය තුළදී විභාගකර දැනගත හැකියි.

2. ඉල්ලුම්කරන්නට කැමති අය විසින් ඔවුන් ඉල්ලුම්කරන්නට අදහස්කරන ඉඩමේ ප්‍රමාණය හා එය පිහිටි ස්ථාන යද, ඉඩම ලැබුනොත් එහි දමන්නට අදහස්කරන වැවිලිද සඳහන්කොට ඒ සම්බන්ධ ඉල්ලුම්පත්‍ර ලියා 1934ක්වූ මැයි මස 1වෙනි දින හෝ ඊට ඉස්සෙල්ලා හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමා වෙත යැවිය යුතුයි. ඉල්ලුම්පත්‍රය සමග මුදලක් බැඳීම වුවමනා නැත. ඉල්ලුම්කරු ගම් කිපයකින් ඉඩම් ඉල්ලුම්කිරීමට අදහස්කරසිටින්නේනම් ඒ එක එක ගම වෙනුවෙන් එක් එක් ඉල්ලුම්පත්‍රය බැගින් යැවිය යුතුයි. ඉල්ලුම්පත්‍ර පිළිබඳ වැඩිමනත් කරුණු ආණ්ඩුවේ උප දිසාපතිතුමාට කියාදෙනු පිණිස ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. ඉල්ලුම්කරු හෝ ඔහු වෙනුවෙන් පෙනීසිටීමට ලියවිල්ලකින් බලයලත් අන් කෙනෙක් හෝ ඉඩම් කච්චේරියට නොපැමිණියේනම් ඔහු තම ඉල්ලීම අත්හැර දැමූ සැටියට හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් සලකනවා ඇත.

3. මේ ඉඩම් කොටස් වෙන්කර දෙන්නේ මධ්‍යම පන්තියේ ලාංකිකයන්ට පමණයි. මධ්‍යම පන්තියේ ලාංකික යන් සැටියට 1932කේ ආදායම්බදු ආඥාපණතේ ප්‍රකාර 1933 මාර්තු මස 31වෙනිදසින් අවසන්වන අවුරුද්දට ගණන් බලනලද නීත්‍යනුකූල ආදායම රුපියල් 6,000කට වැඩිවන්නාවූ කිසිම අයෙක් ඇතුළත් නොවන්නේය. විවාහවූවන් සම් බන්ධයෙන් වූවිට ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේම නීත්‍යනුකූල ආදායම එකතුවූවිට රුපියල් 12,000කට වැඩිවෙතොත් ඒ ස්ත්‍රී හෝ පුරුෂයා මධ්‍යම පන්තියේ ලාංකිකයකුමෙන් සලකනු නොලැබේ. ඉඩම් වෙන්කරදීම අක්කර 5ටත් 50ටත් අතරේ කට්ටි වලට සීමාකරනු ලැබේ.

4. මේ දැන්වීමේ ප්‍රකාර තෝරාගත් ඉල්ලුම්කරුවන්ට දෙනලද ඉඩම් කට්ටි ඉඩම් සශ්‍රීකකිරීම පිළිබඳ ආඥාපණත වලංගුවූවිට ඒ ආඥාපණතේ බලයට යටත්වන්නේය. ආඥාපණත වලංගුවනතුරු ඒ ඉඩම්කට්ටි භුක්තිවිඳීම පහත පෙනෙන කොන්දේසි ඇතුළු තවත් එබඳු කොන්දේසි පිට පවත්නා අවසරපත්‍ර පිටවන්නේය.

(i.) අවසරපත්‍රලත් අය විසින් මේ අවසරපත්‍රය පිට තමාට පැවරෙන අයිතිවාසිකම විකිණීම හෝ වෙනයම් අන්දම කින් අන් සතුකිරීම කලින් ඒ සඳහා හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමාගෙන් අවසරයක් ලබාගෙන මිස මොනයම් කරුණක් නිසාවත් නොකට යුතුයි. තවද අවසර ලබානොගෙන කරන එබඳු ඒ කොයියම් විකිණීමක් හෝ අන්කිසි පැවරීමක් ඇතහොත් එය වලංගු නොවන්නේය.

(ii.) අවසරපත්‍රලත් අය විසින් අවුරුදුපතා මුදලක් ගෙවිය යුතුයි. මුලින් ගෙවන ගණන අක්කරයකට රු. 1කට වැඩිනොවිය යුතුයි. නමුත් මෙය කලින්කල වෙනස්විය හැකියි.

(iii.) අවසරපත්‍රලත් අය විසින් පළමුවෙනි තුන් අවුරුද්ද තුළ ඉඩමෙන් යටත්පිරිසෙයින් දහයෙන් තුන් කොටසක් වත් එළිකොට වැවිය යුතුයි. ඊළඟ දෙවුරුද්ද තුළ මුළු ඉඩමේ ප්‍රමාණයෙන් යටත්පිරිසෙයින් තවත් දහයෙන් දෙකොටසක්වත් එළිකොට වැවිය යුතුයි. ඊළඟ පස් අවුරුද්ද තුළ මුළු ඉඩමේ ප්‍රමාණයෙන් යටත්පිරිසෙයින් තවත් හතරෙන් කොටසක්වත් එළිකොට වැවිය යුතුයි. අවසරපත්‍රලත් අය තම අවසරපත්‍රයෙහි නියමිත කාලය තුළ ඉඩමේ නියම ප්‍රමාණයක් එළිකර වැවීමට බැඳුණේද, ඒ ප්‍රමාණයෙහි නොකඩව වැවිලි ගොවිතැන් කරගෙනයායුතුයි.

(iv.) ඉඩමේ තිබෙන ලීදබ්බු ඉඩමේ මුරපැල් හෝ ගෙවල් තැනීම සඳහා හෝ වැටවල් බැඳීම සඳහා ගැනීමට අවසරලත් අයට බලය තිබේ. එහෙත් හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමාගේ අවසරය නොමැතිව ඉඩමෙන් ලීදබ්බු කිසිවක් පිට ගෙනයෑමට ඔහුට බලයක් නැත. එකී ආණ්ඩුවේ උප දිසාපතිතුමාට සුදුසුයයි වැටහෙන අන්දමකට ගෙවිල්ලක් ඇතුව හෝ නැතුව ඒ සඳහා වුවමනා අවසරය දියහැකියි.

(v.) අවසරලත් අය අවසරපත්‍රයේ කොන්දේසිවලින් කොයිකක් වුවත් ඉෂ්ට නොකරහැරියොත් නැත්නම් අවසර පත්‍රලත් අයට විරුඞව තිබෙන හබ තීන්දුවක් ඉෂ්ටකිරීම පිණිස එකී ඉඩම හෝ අවසරපත්‍රලත් අයට ඇති අයිතිවාසිකම් තහනම්ට ගතහොත් හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමාට අවසරපත්‍රය අවලංගුකොට ඉඩම සහ එහි තිබෙන යම් අස්වැන්නක්, වගාවක්, ගෙයක් හෝ වෙනයම් දියුණුකිරීමක් ඇතහොත් එය තම අත්අඩංගුවට ගතහැක; එපමණක් නොව අවසරපත්‍රලත් අය විසින් හෝ වෙනයම් කෙනෙකු විසින් ඉඩමෙහි කරතිබෙන යම් දියුණුවක් පිළිබඳව තමන්ට සිදුවන පාඩුවක් ගැන කිසියම් ගෙවිල්ලක් ඉල්ලාසිටීමට අවසරපත්‍රලත් අයට හෝ ඔහු වෙනුවෙන් ඉල්ලුම්කරන වෙනයම් කෙනෙකුට හෝ කිසි අයිතිවාසිකමක් නැත.

(vi.) මෙහි දෙනලද ඉඩමෙන් යම් කොටසක් මංමාවත්, ඇළවල් හෝ වෙනයම් කටයුත්තක් සඳහා ආණ්ඩුවට මින්මතු වුවමනා කෙරේනම් අවසරපත්‍රලත් අය විසින් එය ගෙවිල්ලක් නොලබා භාරදිය යුතුයි.

(vii.) අවසරපත්‍රය බලපවත්නා කාලය තුළ අවසරලත් අයගේ මරණය සිදුවුණේනම් ඔහු වෙනුවෙන් හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් අලුත් අවසරපත්‍රයක් අයවලාට නිකුත්කළ යුතුයයි තමා කැමති අයකුගේ නම නියම කිරීමට අවසරපත්‍රලත් අයට බලය තිබේ.

(viii.) අවසරපත්‍රය එය ලත් අයට පුද්ගලිකවූවක් වේ. එය අවසන්වන්නේ ඔහුගේ මරණය සිදුවූවිට වේ.

(ix.) අවසරපත්‍රයෙහි කාලය අවසන්වූවිට ඉඩම නැවතත් රජසන්තක වියයුතුයි. එහි කරතිබෙන කොයියම් දියුණුවක් ගැනවත් වන්දියක් ඉල්ලාසිටීමට කිසිම අයකුට බලයක් නැත.

(x.) අවසරපත්‍ර ලත් අයගේ මරණයෙන් අවසරලත් අයගේ කාලය අවසන්වූවිට නැසීගිය අවසරලත් අය විසින් නම් කරනලද අය අවසරපත්‍රය ලැබීමට සුදුස්සෙක්යයි තමාට කල්පනාවේනම් ඔහුට හෝ නැසීගිය අවසරපත්‍ර ලත් අයගෙන් පැවතෙන්නාවූ කොයියම් අයකුට හෝ අභිමත පරිදි ඒ ඉඩම් සම්බන්ධයෙන් අවසරපත්‍රයක් නිකුත්කිරීමට හම්බන්තොට ආණ්ඩුවේ උප දිසාපතිතුමාට බලය තිබේ.

5. ඉඩම කලින් මැන සුදුසුලෙස කට්ටිවලට සාඩානැත්නම් ඉඩම අවසාන වශයෙන් පවරාදීම එය මනිනතුරු කල් දැමීමට පිළිවන.

6. තෝරාගත් ඉල්ලුම්කරුවන් විසින් අක්කරයකට රුපියල් 3 බැගින් මැනුම් ගාස්තු ඉඩම් කච්චේරියෙහිදී තැන්පත් කිරීම අවශ්‍යවිය හැකිය. ඉල්ලුම්කරුගේ යම්කිසි ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා ආණ්ඩුවට උවමනා නැති අමතර මැනීමක් කිරීමට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මැනුම් ගාස්තු ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්ති සහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරනතීරණය අවසාන තීරණය වන්නේය.

වර්ෂ 1934ක්වූ මාර්තු මස 21වෙනි
දින කොළඹදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමා.

ඉඩම් සම්බන්ධ විස්තර.

(1) උතුරට තහනම්කැලේ; දකුණට ආණ්ඩුවේ ඉඩම්, කෝන්ගහකොරටුව සහ මීමාමලකෙමෙවත්ත; නැගෙණහිරට ආණ්ඩුවේ ඉඩම්; බස්නාහිරට මිද්දෙනියේ සහ හුන්ගම පාර සහ තලාවේගමේ මායිම්—යන මේ මායිම්තුළ පිහිටි අවසාන සිතියම් නොම්මර 406 දරණ දෙබොක්කාව යන ගමේ ලොට් නොම්මර 2කේ ඉඩමෙන් අක්කර 116ක් පමණවේ.

(2) උතුරට කාරියම්ඹිත්ත යන ගම සහ කට්ටිගල්ආර; දකුණට ආණ්ඩුවේ ඉඩම්, කටුකුරුඳුගහහේන කළුගහහේන සහ කොලොන්ගහහේන; නැගෙණහිරට තඹලපැලැස්ස යන ගම; බස්නාහිරට ආණ්ඩුවේ ඉඩම් සහ කාරියම්ඹිත්තගම—යන මෙකී මායිම්තුළ පිහිටි අවසාන සිතියම් නොම්මර 407 දරණ දඹරැල්ල යන ගමේ ලොට් නොම්මර 2කේ ඉඩමෙන් අක්කර 287ක් පමණවූ පැහිරි සහ වෙනත් වැව්ලිවලට සුදුසු භූමිභාගයයි.

(3) උතුරට සබරගමුපලාත; දකුණට මිද්දෙනියේගම; නැගෙනහිරට කොලොන්නකෝරළේට යන පාර සහ කුඩ ගොඩගම; බස්නාහිරට ආණ්ඩුවේ ඉඩම්—යන මේ මායිම්තුල පිහිටි අවසාන සිතියම් නොම්මර 395 දරණ හැල්ලල යන ගමේ ලොට් නොම්බර 1කෙන් අක්කර 120ක් ප්‍රමාන භූමිභාගයයි, මේ ඉඩම් කපු සහ වෙනත් සෂ්‍යමාරු වැව්ලිවලට සුදුසුවේ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3හේ ආඥාපත්‍රයේ 7වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—පොතුවිල ස්වභාෂා පිරිමි පාඨශාලාවක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 269. ගම—පොතුවිල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කලුවාවත්ත .. | පොල්ගස් 4ක්, කජුගහක්, ගොඩපරගහක්, කරදගහක්, කොච්චිම්බාගහක්, (අවුරුදු 20–40 දක්වා පරනවූ) ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ අඩාරබිත්ති කොටසකින්යුත් වත්ත | පොතුවිල පදිංචිකාරයෝවන—(1) සිංගප්පුලිආරච්චිංග දෙන් අර්නෝලිස් සිරිවර්ධන, (2) දේවාලවිතානගේ මැනික්හාමි, (3) එන්දරගෙ කරෝහාමි, (4) කරුණාඹිකි සයිමන්සිල්වා, (5) දෙන් මාටින් අගලවත්ත, (6) පල්ලියරල්ලාගෙ දොන ලූසිනෝනා | 0 0 24·4 |
| 2 | එම .. | පොල්ගස් 9, නාගස් 4, කිතුල්ගහක්, ගොඩපරගස් 4ක්, කොච්චිම්බාගහක්, කැන්ද ගහක්, අවුරුදු 20–40 දක්වා පරන හික් ගස් 3, අවුරුද්දක් පමණවූ කෙසෙල් පඳුරු 2, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, ස්ථිර ගොඩනැගිල්ලක්, තාවකාලික ගොඩනැගිල්ලක්, ගලින් බඳිනලද ගල්පඩි 3ක් සහ අඩාරබිත්ති කොටසකින්යුත්වත්ත | මොරගල්ල පදිංචි, විලියම් ද සොයිසා රාජපක්ෂ | 0 2 29·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ අප්‍රේල් මස 20 දින පෙරවරු 10ගේ කාලසමට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මාර්තු මස 22වෙනි දින
කළුතර කච්චේරියේදීය.

පී. සරවනමුත්තු,
කළුතර දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—මහනුවර දෙහිඅන්නෙවෙල් නාගරික සභාව විසින් සාදා තිබෙන ආදයි ගෙවල්වල පදිංචිකාරයින්ට හරක්ගාල් සහ කරත්ත මඩු සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම් :—

සිතියමේ නො. A 44. නම—මහනුවර නගර සීමාව තුළ දෙහිඅන්නෙවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. පා. |
|---|---|---|---|---|
| 1 | ගලහිටියාව වරිපනම් නො. 33A, 33B, සහ 34 (දෙහිඅන්නෙවෙල පාර) | වත්ත | (1) ගැටඹේ පදිංචි වී. ඒ. ඇස්. පිල්ලයි, (2) නාථ දේවාලේ වෙනුවට මහනුවර පී. බී. වඩුගොඩපිටිය | 0 0 13·6 |
| 2 | ගලහිටියාව නොහොත් බතලමුරේ වරිපනම් නො. 2, 3, 3A, 3B (ආරෝග්‍යශාලාවට යනපාර) සහ $34^1$, $34^1$A සහ $34\frac{1}{2}$ (දෙහිඅන්නෙවෙලපාර) | එම | පී. සින්නොච්චි ප්‍රනාන්දුගේ උරුමක්කාරයෝ වන (1) පී. එච්. දියෝනිස් ප්‍රනාන්දු, (2) නිනා ප්‍රනාන්දු, (3) නාථදේවාලේ වෙනුවට මහනුවර පී. බී. වඩුගොඩපිටිය | 0 0 12·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියම කර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ අප්‍රේල් මස 30වෙනි දින පස්වරු 2ක් කාලිනමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මාර්තු මස 21වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුනවර්ධන,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## ටෙණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

වර්ෂ 1934ක්වූ මැයි මස 26වෙනි දින පෙරවරු 10.30ට, මාතර උප ඒජන්ත උන්නාන්සේ විසින් මිනිරන් තිබෙන වායයි පිරික්සාකරන මාතර දිස්ත්‍රික්කයේ පිහිටි මෙහි පහත විස්තර සඳහන් ඉඩමේ මිනිරන්කැනීමේ අයිතිවාසිකම මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනබව මෙයින් දැනුම්දෙමි.

1. මිනිරන්කැනීමේ බලය G. A. A35 දරන පෝර්මයේ සඳහන් රෙගුලාසි සහ කොන්දේසිවලට යටත්ව අවුරුදු පහකට බදුදෙනු ලැබේ. (එකී පෝර්මයේ පිටපත් මාතර කච්චේරියේදී බලාගත හැක.)

2. අවුරුද්දට බදුමුදල රුපියල් සීයක් (100)ක් වේ.

3. බද්ද විකිනීමේ තක්සේරු මිල රුපියල් දෙසීයක් (200)ක් වේ. වැඩි ඉල්ලුම්කාරයා ඔහුගේ ඉල්ලීම රුපියල් දෙසීයකට වැඩිවූනොත් ගැනුම්කාරයා වෙනුලැබේ.

4. (*a*) ඉල්ලුම්කාරයා ගැනුම්කාරයා හැටියට පිළිගත්තාට පසු මිට ඉහතින් මුදලක් තැන්පත්කලා හෝ නොකලා හෝ ඉල්ලුම්කරනලද මුදලෙන් සියයට 10ක් එවලේම මාතර උප ඒජන්ත උන්නාන්සේ වෙත තැන්පත්නොකළොත් එසේම විකිනීමේ කොන්දේසිවලට අත්සන් නොකළොත් ඉල්ලීම බාරනොගනු ලැබේ.

(*b*) මාතර උප ඒජන්ත උන්නාන්සේ වෙන්දේසියේදී යම් ඉල්ලීමක් පිළිගන්නට මත්තෙන් ඉල්ලුම්කාරයාගේ නියම තත්වය දැනත් ඔහුට තැන්පත්කරන්ට වුවමනා මුදල ගෙවන්ට පුළුවන්ද යනවගක් ඒත්තුගත යුතුවේ. එසේ ඒත්තුනොගත්තොත් ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේපකර එබඳු ඉල්ලීමක් නොකලසේ වෙන්දේසිය නොකඩවා ගෙනයනවා ඇත.

5. ගැනුම්කාරයා වෙන්දේසි දිනෙන් සිව මාසයක් ඇතුලත මිලයටගත් මුදලේ ඉතුරුකොටස මාතර උප ඒජන්ත උන්නාන්සේට ගෙවිය යුතුවේ. එසේ බැරිවුනොත් මිලයටගැනීම අවලංගු හැටියට සලකා බද්ද වෙනුවෙන් ගෙවනලද සියයට 10යේ මිල කොටස සහ වෙනත් මුදල් රාජසන්තක කරනවා ඇත.

6. නියමකරපු කාලය ඇතුලත මිලටගත් මුදලේ ඉතුරු කොටස මාතර උප ඒජන්ත උන්නාන්සේට ගෙවා සම්පූර්ණ කලාට පසු ඉඩම මැනීමේ වැඩ අවසානවූවහාම මාතර උප ඒජන්ත උන්නාන්සේ විසින් ගැනුම්කාරයාට බදු ඔප්පුවක් දෙනවා ඇත. ගැනුම්කාරයාට බදු ඔප්පුව දෙන්ට ප්‍රථම මිනිරන්කැරීමේ වැඩපටන්ගන්ට උවමනානම් අවසරලත් මිනින්දෝරු මහතෙකු විසින් ඉඩම මැන සාදනලද ප්ලෑනයක් උප ඒජන්ත උන්නාන්සේට භාරදුන්නායින් පසු වැඩපටන් ගන්ට ඔහුට ඉඩදෙන්ට පුළුවන.

7. වෙන්දේසි දිනයේදී ඉඩමේ තිබෙන ද්‍රව්‍යවල සම්පූර්ණ වටිනාකම ගැනුම්කාරයා විසින් ගෙවන්ට ඕනෑය.

8. බද්ද අවසානයේදී භාරනලද පතල් සියල්ලම බදුකාරයා විසින් ඔහුගේ වියදමින් වැස්සවිය යුතුයි. වැඩ පටන්ගන්ට මත්තෙන් මේ සඳහා ඇප වසයෙන් රුපියල් සීයක් (100)ක් ගැනුම්කාරයා විසින් මාතර කච්චේරියේ තැන්පත්කරන්ට ඕනෑය.

ඇල්. ඇල්. හන්ටර්,
මාතර උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1934ක්වූ මාර්තු මස 21වෙනි දින
මාතර කච්චේරියේදීය.

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම්කෝරලේ අංක 181 දරණ අවසාන ගම් සිතියමේ සඳහන් ඉලුප්පැල්ල යන ගමේ පිහිටි නො. 70 දරණ තියඹිරාහේන නොහොත් කොරටුවේහේන නමැති ආණ්ඩුවේ බිමෙන් උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට ආණ්ඩුවේ කැලෑවෙන්ද, දකුණට හිදකරදෙනියේ දෙලට වෙන්කරනලද බිමෙන්ද මායිම්වූ අක්කරයක බිමවේ.

අකුරැස්ස සහ මලිදූව දිස්ත්‍රික් කොම්පි පාරේ සිට හැතැක්ම $1\frac{1}{2}$ක් පමන දකුණෙන් මෙම ඉඩම පිහිටා තිබේ.

---

## අන්‍ය දැන්වීම.

1907වෙනි අවුරුද්දේ 1වෙනි රෙගුලාසියේ 8වෙනි වගන්තියේ 1වෙනි පෙළේ B අක්ෂරය දරන වගන්තියපිට දැන්වීමයි.

මෙහි පහත අත්සන්කරණ මඩකලපුවේ තාමරකේනියේ පදිංචි අම්බලවානර් කණේස මුදලි වන මා මඩකලපු දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාවෙන් වැඩකරන නොතාරිස් කෙනෙක්ව පත්කරන ලෙස අද පටන් තුන්මාසයක් පසුවූ තැන ලංකාවේ රිජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙත අයදුම්පතක් යැවීමට අදහස් කරගත් බව මෙයින් මහජනයා වෙත දන්වා සිටිමි.

A. Ganeshamuthali.

මඩකලපුවේ තාමරකේනියේදීය.
22. 2. 34.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.